1.පාඩම හෝ ඒකකය- **භූපාලි රාගයේ රාග සංගති,ස්වර අභ්‍යාස සහ සර්ගම් ගීත ගායනය.**

2.නිපුණතාවය 1.0 -සංගීතයේ මූලිකාංග,ශිල්පාංග සහ සිද්ධාන්ත හඳුනා ගනිමින් ගායන/වාදන හැකියා ප්‍රදර්ශනය කරයි.

3.නිපුණතා මට්ටම 1.1 - ආරෝහණයේ සහ අවරෝහණයේ විවිධ ස්වර ඇතුළත් රාග හඳුනා ගනිමින් ගායන හැකියා වර්ධනය කර ගනියි.

4.පෙර ඉගෙනුම් අවස්ථා/ශිෂ්‍යා කළ යුතු කාර්යයන් :

- ❖ ඔබ 9 ශ්‍රේණියේ පළමු වාරයේ අධ්‍යයනය කළ බිලාවල් රාගය සියලුම ස්වර ශුද්ධ ස්වර සහිත රාගයක් බව මතකයට නගා ගන්න.

- ❖ ඔබ දෙවනි වාරයේ දී අධ්‍යයනය කරන්නේ ද සියලුම ස්වර ශුද්ධ වන රාගයකි. එනම් භූපාලි රාගයයි.නමුත් භූපාලි රාගයේ මධ්‍යමය සහ නිෂාදය යෙදෙන්නේ නැත. (ම සහ නි වර්ජිතය)

- ❖ දැන් ඔබ 9 ශ්‍රේණියේ දෙවන වාරයට නියමිත මෙම භූපාලි රාගය පිළිබඳ ඉගෙන ගැනීමට පහත සඳහන් පොත්පත්,Web Site , LMS පාඩම් හා ඉගෙනුම් ආධාරක පහත link ඔස්සේ නරඹන්න.

- e-තක්සලාව :
  1.https://youtu.be/VuIzCrDWakw?list=PLt-xuEc4if22aQ13m3IQmpFyVsVHSV_TJ
  2.https://youtu.be/GKlt_y0C6jE?list=PLt-xuEc4if22aQ13m3IQmpFyVsVHSV_TJ

- e-නැණපියස :
  1.9 පෙරදිග සංගීතය: භූපාලි ස්වර අභ්‍යාස (enenapiyasa.lk)
  2. 9 පෙරදිග සංගීතය: භූපාලි සරිගම් (enenapiyasa.lk)
- Youtube :
  1. https://youtu.be/FlSOT6cZyk8 -භූපාලි රාගය -කථිකාචාර්ය අසිත් අතපත්තු මහතා
  2. https://youtu.be/bBP3hqhENsA - භූපාලි රාගය- සංජය වසන්ත මහතා
  3. https://youtu.be/-tj6BuKNwKg - භූපාලි රාගය - චමිලා නිශාන්ති එඩ්වඩ් මිය

- ❖ එසේ තාක්ෂණය ඔස්සේ නැරඹිය නොහැකි දරුවන් සඳහා පහත සඳහන් කියවීම් පත්‍රිකාව තුළ ඇතුළත් ස්වර අභ්‍යාස සහ සර්ගම් ගීත ආධාරයෙන් ගායනයට /වාදනයට හුරු වන්න. සංගීත ගුරුතමා/තුමිය ගෙන් උදව් ලබා ගන්න.

<u>කියවීම් පත්‍රිකාව</u>

## <u>භූපාලි රාගයේ රාග විස්තර</u>

- ආරෝහණ - ස රි ග ප ධ ස්
- අවරෝහණ - ස් ධ ප ග රි ස
- මේලය/ථාථය - කළ්‍යාණ
- ජාතිය- ඖඩව-ඖඩව
- ගායන සමය -රාත්‍රී ප්‍රථම සමය
- වාදී - ග
- සංවාදී - ධ.
- මුඛ්‍යාංගය - ගරි,සධ , සරිග,පගධපග,රිස
- විශේෂ ස්වර සංගති - සරිස,ගප,ගරිස,ස්ස්ධ,ධධස්
- විශේෂ ලක්ෂණ - 1. සියලුම ස්වර ශුද්ධයි.
  2. මධ්‍යමය සහ නිෂාදය වර්ජිතයි.
  3.ඖඩව ජාති වාදී රාගයකි.

## <u>භූපාලි රාගයේ රාග සංගති කිහිපයක්</u>

1.සධ,සරිග
2.සරිගපග,ධපග
3.ගප,ධ ස්
4.ගරි,සරිස,ධරිස
5.ගපධස්, රි්ග්රි්ස්,ධපග

## <u>භූපාලි රාගයේ ස්වර අභ්‍යාස</u>

1. ස රි ස
   ස රි ග රි ස
   ස රි ග ප ධ ප ග රි ස
   ස රි ග ප ධ ස් ධ ප ග රි ස
   ස රි ග ප ධ ස් රි් ස් ධ ප ග රි ස

2. සරි ගගරිස
   සරිගපගගරිස
   සරිගප ධධපපගගරිරිස
   සරිගප ධධස් ස් ධධපපගගරිරිස

## <u>සර්ගම් ගීතය(ත්‍රි තාලය)</u>

| | | | | |
|---|---|---|---|---|
| ස්ථායි | ස් ස් ධ ප<br>ග ප ධ ස් | ග රි ස රි<br>රි් ස් ධ ප | ග - ප ග<br>ස් ප ධ ප | ධ ප ග -<br>ග රි ස - |
| අන්තරා | ග ග ප ධ<br>ග් ග් රි් ස් | ප ස් - ස්<br>රි් රි් ස් ධ | ධ ධ ස් රි්<br>ස් ස් ධ ප | ග් රි් ස් ධ<br>ග රි ස - |

- ❖ අතිරේක පොත්/සඟරා :
  1.[music book l2.pdf (enenapiyasa.lk)]
  2.අතිරේක කියවීම් පොත- පෙරදිග සංගීතය-9 ශ්‍රේණිය
  3.සංගීත අධ්‍යයනය-ගුණපාල විතානගේ මහතා
  4. පෙරදිග සංගීතය-9 ශ්‍රේණිය- ජානක බණ්ඩාර ජයලත් මහතා

5.මෙම සතිය තුළ නියමිත පාඩම්වලින් ලබා ගත යුතු ඉගෙනුම් ඵල :

- භූපාලි රාගයට අයත් ස්වර නම් කරයි.
- භූපාලි රාගයට අයත් කෙටි ස්වර ඛණ්ඩ(රාග සංගති) හඳුනා ගනියි.
- ස්වර 5 ක් යෙදුනද භූපාලි මිහිරි රාගයක් බව පිළිගනියි.
- ස්වර සංගති හඳුනා ගනිමින් භූපාලි රාගයේ ස්වර අභ්‍යාස නිවරදිව ගායනය /වාදනය කරයි.
- සර්ගම් ගීත ස්වර පමණක් ඇතුළත් ගීත බව පිළිගනියි.
- සර්ගම් ගීතය නිවරදිව ගායනය/වාදනය කරයි.
- සර්ගම් ගීතය පුහුණු වීමෙන් රාගය අධ්‍යයනය කිරීමට පහසු බව ප්‍රකාශ කරයි.

6.ඇගයීම්/තක්සේරුකරණ ක්‍රමවේද හා ආකෘති :

1. ඔබ නැරඹූ නුර්ති ගීත ඇතුළත් vedio පාඩම් ඇසුරින් භූපාලි රාගයේ ස්වර අභ්‍යාස සහ සර්ගම් ගීතය ගායනයට වාදනයට යොමු වන්න.

2.එසේ තාක්ෂණය ඔස්සේ නැරඹිය නොහැකි දරුවන් සඳහා ඉහත සඳහන් කියවීම් පත්‍රිකාවට අදාළ ගීත හා ස්වර ප්‍රස්තාර ආධාරයෙන් භූපාලි රාගයේ ස්වර අභ්‍යාස සහ සර්ගම් ගීතය ගායනයට /වාදනයට හුරු වන්න.

3. භූපාලි රාගයට අයත් කෙටි ස්වර ඛණ්ඩ 4 ක් ලියන්න.

4.ඔබ 9 ශ්‍රේණියේ මෙතෙක් අධ්‍යයනය කළ රාග දෙක ඇසුරින් පහත වගුව සම්පූර්ණ කර ගුරුතුමාට/ගුරුතුමියට ලබා දී නිවැරදිතාවය තහවුරු කර ගන්න.

| රාගය | මේලය | ජාතිය | ආරෝහණ | අවරෝහණ | වාදී | සංවාදී | මුඛ්‍යාංගය | ගායන සමය | විශේෂ ලක්ෂණ |
|---|---|---|---|---|---|---|---|---|---|
| බිලාවල් | | | | | | | | | |
| භූපාලි | | | | | | | | | |

පාඩම සැකසුම : නිවිතිගල අධ්‍යාපන කලාපය

සෞන්දර්ය අංශය